බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

# 11 - ශ්‍රේණිය

# ඉතිහාසය

# පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 4 | (11) - 1 | (21) - 1 | (31) - 4 |
| (2) - 3 | (12) - 4 | (22) - 3 | (32) - 2 |
| (3) - 4 | (13) - 3 | (23) - 2 | (33) - 4 |
| (4) - 1 | (14) - 2 | (24) - 3 | (34) - 1 |
| (5) - 2 | (15) - 4 | (25) - 1 | (35) - 3 |
| (6) - 4 | (16) - 3 | (26) - 2 | (36) - 1 |
| (7) - 3 | (17) - 1 | (27) - 4 | (37) - 4 |
| (8) - 2 | (18) - 3 | (28) - 3 | (38) - 2 |
| (9) - 2 | (19) - 2 | (29) - 3 | (39) - 1 |
| (10) - 3 | (20) - 4 | (30) - 1 | (40) - 4 |

## II පත්‍රය

### I කොටස

1. (අ) ලංකා, ලෝක සිතියමේ දක්වා ඇත. (ලකුණු 18)

(ආ) i. A - ටොලමි B - පළමුවන පරාක්‍රමබාහු රජු
C - ඇඩොල්ෆ් හිට්ලර් D - ජර්මන් ජාතික ජොහැන්හස් ගුටන්බර්ග් (ලකුණු 04)

ii. A (1) හෙන්රි ස්ටීල් ඕල්කොට්තුමා (2) ඇමරිකාවේ (3) සරසවි සඳරැස (4) පානදුරාවාදය
(ලකුණු 04)

B (1) බෞද්ධ (2) අංකෝර්වට් විහාරය (3) කාම්බෝජය (4) 12 වන සියවසේ (ලකුණු 04)

### I කොටස

2. i. • ඇරිස්ටෝටල් • මෙගස්තිනීස් • රෝම ජාතික ප්ලිනි (ලකුණු 03)

ii. • ගොඩවාය ටැම් ලිපිය • බදුලු ටැම් ලිපිය • මිහින්තලා පුවරු ලිපිය / කළුදිය පොකුණ / අභයගිරි සංස්කෘත ලිපිය • සිතුල්පව්ව සෙල්ලිපිය (ලකුණු 04)

iii. • එළාර රජු පරදවා ලක්දිව ද්‍රවිඩ පාලනයෙන් නිදහස් කරගැනීම.
• රුවන්වැලි සෑය, ලෝවාමහාපාය, මිරිසවැටිය වැනි බෞද්ධ චෛත්‍ය හා ගොඩනැගිලි ඉදිකිරීම් කරවා බුද්ධ ශාසනය දියුණු කිරීම.
• දීඝවාපියේ කෘෂිකර්මාන්තය දියුණු කරවා රට ස්වයංපෝෂිත කිරීම.

කරුණු දෙකකට ලකුණු 02
විස්තරයට ලකුණු 03
05

iv. • බුදු දහමින් හික්මු වූ සාමකාමී ජනජීවිතයක් ගත කිරීම.
• පීතෘමූලික සමාජයක් පැවතියත් කාන්තාවන්ට නිදහසේ කටයුතු කිරීමට අවස්ථාව දී තිබුණි.
• කෘෂිකර්මාන්තය පදනම් කරගත් ජනජීවිතයක් පැවතීම.
• විවිධ වෘත්තීන් නියැලුණු ජනතාව සිටියහ. (වෙළඳ, රන් කර්මාන්තය, රිදී කර්මාන්තය, වඩු කර්මාන්තය)

කරුණු තුනකට ලකුණු 03
පැහැදිලි කිරීමට 03
06

3. i • වසභ රජු • මහසෙන් රජු • දෙවන මුගලන් රජු (ලකුණු 03)

ii • වී වගාව ප්‍රධාන ජීවනෝපාය වීම.
• ගංගා ජලය වී වගාවට ප්‍රමාණවත් නොවීම.
• වර්ෂාව අවුරුද්දේ එක් කාලයකට සීමා වීම.
• වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම.
• ජන සංඛ්‍යාව අධික වීමෙන් වගාබිම් පුළුල් වීම. (ලකුණු 04)

iii. • කලාවැවේ සිට තිසාවැවට යෝධ ඇල දිගේ කි. මී. 1 ට මිලි මීටර් 95ක බෑස්මකින් ජලය ගෙන ඒම.
• සමස්ත වියළි කලාපයම ආවරණය වන ලෙසට වැව් සෑදීම.
• උමං ජල තාක්ෂණක්‍රමය, (නළ මගින් පොළොව යටින්) ජලය ගෙනයෑම.
උදා :- රන්මසු උයන, කුට්ටම් පොකුණ, සීගිරිය.
• භූමියේ හැඩතල අනුව ඇලමාර්ග හා වැව් ඉදිකිරීම.

කරුණු දෙකකට ලකුණු 02
විස්තර කිරීමට 03
05

iv. • දුර්වල පාලකයන් බිහිවීම.
(වීරබාහු, දෙවන වික්‍රමබාහු, ලීලාවතී රැජින, සහස්සමල්ල, කල්‍යානවතී බිසව, අයිකංග වැනි පාලකයින්)
• දරුණු කාලිංග මාඝ විදේශීය ආක්‍රමණිකයාගේ ප්‍රබල ආක්‍රමණය හා විනාශකිරීම්.
• මැලේරියාව වැනි වසංගත රෝග බෝවීම

කරුණු තුනකට ලකුණු 03
පැහැදිලි කිරීමට 03
06

4. i. a. කෝට්ටේ - 8 වන වීර පරාක්‍රමබාහු
b. කන්ද උඩරට - සේනා සම්මත වික්‍රමබාහු
c. යාපනය - පරරාජ සේකරම්

ii. a. ලොරෙන්සෝ ද අල්මේදා b. ජොරිස් ෆන් ස්පිල්බර්ජන්
c. ජෝන් ෆයිබස් d. දොන් ජෙරනිමෝ ද අසවේදු (ලකුණු 04)

iii. ආගමික සේවය
• දෙල්ගමුවේ සඟවා තිබූ දන්තධාතුව මහනුවරට වඩම්මවා දළදා මාළිගයක් කරවා එහි තැන්පත් කිරීම.
• බුරුම දේශයෙන් (මියන්මාර්) භික්ෂූන් වහන්සේලා වැඩමකරවා යළි උපසම්පදාව ඇති කිරීම.
• ලංකාතිලකය, ගඩලාදෙණිය වැනි විහාර ප්‍රතිසංස්කරණය කිරීම.
• ශ්‍රී පාදස්ථානයේ භාරකාරීත්වය නැවත පවරා දීම.
• බෞද්ධ අධ්‍යාපනික කටයුතු දියුණු කිරීම.

දේශපාලන සේවය
• උඩරට රාජ්‍යයේ ස්වාධීනත්වය රැකගැනීම.
• රාජ්‍ය උරුමය තහවුරු කරගැනීම සඳහා නීත්‍යානුකූල උරුමක්කාරිය වූ කුසුමාසන දේවිය විවාහ කරගැනීම.
• නව රජ පෙළපතක් ඇරඹීම.
• පෘතුගීසි ආක්‍රමණ (දන්තුරේ සටන) වලින් රාජ්‍යය ආරක්ෂා කර ගැනීම.
• රාජ්‍ය උරුමය පිළිබඳ සංකේතය වූ දළදා වහන්සේගේ උරුමය ලබා ගැනීම. (ලකුණු 05)

iv. ගිවිසුමේ අඩංගු වූ කොන්දේසි පහෙන් තුනක්ම ලන්දේසීන්ට වාසි සහගත ආකාරයට සකස් වී තිබිණි.
• වරායන්ගේ අයිතිය ලන්දේසීන්ට ලැබීම.
කොළඹ, ගාල්ල, යාපනය, මාතර, ත්‍රිකුණාමලය, මන්නාරම, කල්පිටිය යන වරායන්ගේ අයිතිය ලැබීම නිසා එහි වාසිය හිමිකර ගත්තේ ලන්දේසීන්ය. උඩරට රාජ්‍යයට වරායන් අහිමිවීමත් ඒ නිසා ආර්ථිකය අඩාලවීමත් සිදුවිය.
• මුහුදුබඩ සරුසාර ප්‍රදේශය ලන්දේසීන්ට සතුවීම.
මුහුදුබඩ ගව්වක් (සැතපුම් 4) පමණ බිම් තීරුව ලන්දේසීන්ට ලැබීම නිසා ජනතාවන්ගේ ජීවන රටාව බිඳවැටුණි. ඒ ප්‍රදේශවල පොල්, කුරුඳු ආදියේ ආදායම ලන්දේසීන් ලබාගත්හ.
• කන්ද උඩරට වෙළඳාමේ අයිතිය ලැබීම.
කන්ද උඩරටට වෙළඳාමට යාම සඳහා, දුව දඬු කපාගෙන යාමටත්, කුරුඳු තැලීමටත් රජුගේ අවසරය ගිවිසුමට අනුව ලැබුණි. ඒ වාසිය ලන්දේසීන් සතුවිය.

5. i. a. ෆෙඩ්රික් නෝර්ත් b. ජෝන් ඩොයිලි c. වයිකවුන්ට් ටොරින්ටන් (ලකුණු 03)

ii • ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම.
• ත්‍රිකුණාමල වරායේ වැදගත්කම.
• පෙර අපර දෙදිග නැව් මාර්ගයේ පිහිටා තිබීම.
• ශ්‍රී ලංකාවේ සිට ඉන්දියාවේ නැගෙනහිර හා බටහිර වෙළඳ මධ්‍යස්ථාන පාලනය කිරීමේ පහසුව.
• වෙළඳ කටයුතු සඳහා ඇති වැදගත්කම.

iii. • බිම්පාලු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.
• මාර්ෂල් ලෝ නම් යුධ නීතිය පැනවීම.
• සටනට නායකත්වය දුන් නායකයින් මරා දැමීම.

iv. • 1840 මුඩුබිම් පණත ක්‍රියාත්මක කිරීම.
• රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
• ගම්සභාවල බලය උසාවි වෙත පැවරීම.
• වතුවගාවට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.

6. i. • ශක්තිමත් ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් බිහිවීම.
• දේශපාලන පක්ෂ දෙකම මනාව සංවිධානය වීම.
• මහජන ඡන්දය අපතේ නොයෑම.

ii • ජනාධිපතිවරණය. • මහ මැතිවරණය. • පළාත් සභා මැතිවරණය. • පළාත් පාලන මැතිවරණය.

iii. • ඡන්දය අපතේ නොයන ආකාරයට නිවැරදිව ඡන්ද භාවිතා කළ යුතුය. (නිවැරදිව ඡන්දය භාවිතය පැහැදිලි කළ යුතුය.)
• නොදනුවත්කමින් ඡන්දය පාවිච්චි නොකර සිටීම
ඡන්දය පාවිච්චි නොකිරීමෙන් අයථා ලෙස වෙනත් අයෙකු ඡන්දය දැමීම, වැනි ක්‍රියා මගින් නිසි පුද්ගලයෙකු තෝරා ගැනීමට හැකි අවස්ථාව මගහැරී යාම.
• තමාට හිමි නැති ඡන්දයක් පාවිච්චි කිරීමෙන් වැළකීම.
අයෙකු ඡන්දයක් පාවිච්චියෙන් නුසුදුස්සයන් තේරීම, ගැටුම් ආරවුල් ඇතිවීම වළක්වා ගත හැකිය.

කරුණු දෙකකට ලකුණු 02
විස්තරයට ලකුණු 03
05

iv. • මුද්‍රිත මාධ්‍යය ලෙස පුවත්පත්, පත්‍රිකා, පෝස්ටර්, පොත්පත් භාවිතා කර දේශපාලන පක්ෂ හා අපේක්ෂයින් පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධියට පත්කළ හැකිය.
• පුවත්පත් ඇසුරු කරගෙන රටේ සියලුම ස්ථානවලට අවශ්‍ය දැන්වීම් ප්‍රචාර කළ හැක.
• රූපවාහිනිය වැනි රූප මාධ්‍යය හා පක්ෂ හා විපක්ෂ මෙන්ම සියලු අපේක්ෂකයන් සමඟ සමාන සාකච්ඡා කාලයක් වෙන්කර මහජනතාව දැනුවත් කළ හැක.
• ගුවන්විදුලිය මඟින් නිවැරදි තොරතුරු සන්නිවේදනය කළ හැක.
• රූපවාහිනිය, ගුවන්විදුලිය මඟින් රාජ්‍ය පාලනය අදාළ ක්‍රියාමාර්ග ගැන ජනතාව පෝෂණය කළ හැක.
• විවිධ දේශපාලන පක්ෂ සංවිධාන සහභාගි කරවමින් ජනතාවට අදහස් ඉදිරිපත් කළ හැක.

## III කොටස

7. i. A - මගධ B - කෝසල C - අවන්ති (ලකුණු 03)

ii. P. මධ්‍යම ආසියාවේ ස්ටෙප්ස් තණබිම් Q. ඛයිබර් දුර්ගය R. ඉන්දු ගංගා නිම්නය
S. වින්ධ්‍යා කඳුවැටිය (ලකුණු 04)

iii. මෞර්ය අධිරාජ්‍යයේ වැදගත් පාලකයෙකු වූ අශෝක රජතුමාගෙන් සිදු වූ <u>ආගමික සේවය.</u>
• තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම. • ධර්ම දූත සේවාව තම දරු දෙදෙනා ද ඒ සඳහා යොදාගැනීම.
• වෙහෙර විහාර ඉදිකිරීම. • ධර්ම මහා මාත්‍ය තනතුරු පත් කිරීම.
• විවිධ ආගම්වලට අනුග්‍රහය දැක්වීම. (ලකුණු 05)

iv. <u>අධ්‍යාපනය</u>
• කුල ක්‍රමය මත අධ්‍යාපනය.
• ගුරු ගෙදර මුල් වූ අධ්‍යාපනය, බෞද්ධ ආගමික අධ්‍යාපනය සඳහා ආයතන පැවැත්වීම.
• උසස් අධ්‍යාපන ආයතන.
• පුළුල් විෂය මාලාව, නිවැරදි ව්‍යාකරණ.

<u>සාහිත්‍යය</u>
• සාහිත්‍යකරුවන්ට රාජ්‍ය අනුග්‍රහය. • උසස් ගණයේ සාහිත්‍ය කෘති බිහිවීම.
• ධර්මශාස්ත්‍ර ග්‍රන්ථ, වෙනත් කෘති බිහිවීම.

<u>ගෘහ නිර්මාණ</u>
• ආගමික ගොඩනැගිලි ඉදිවීම, ගඩොල් ගල්කණු භාවිතය. • අලංකාර කැටයම්, ආරාම සංකීර්ණය.
(ලකුණු 06)

8. i. A. නාවික හෙන්රි B. වස්කෝ ද ගාමා C. ක්‍රිස්ටෝෆර් කොලොම්බස් (ලකුණු 03)

ii. • ඉඩම් හිමියා හා ප්‍රවේණිදාසයා අතර ඇති සම්බන්ධය පුද්ගලබද්ධ පාලන ක්‍රමය.
• ඉඩම් බුක්ති විඳීම වෙනුවෙන් සේවය සැපයීම. • ප්‍රාදේශීය පාලකයන් සතු පෞද්ගලික හමුදාව.
(ලකුණු 04)

iii. • තම ප්‍රදේශයට අවශ්‍ය සියලු දේ ඒ ප්‍රදේශය තුළින්ම සපයා ගැනීම.
• කර්මාන්තවල අමුද්‍රව්‍ය ලෙස ද ප්‍රදේශයේ නිෂ්පාදනයන් යොදාගැනීම. (ලකුණු 05)

iv. • නිශ්චිත භූගෝලීය දේශසීමාවක් තිබීම, රජුවෙත සියලු බලතල කේන්ද්‍රගත වූ පාලනයක් රදළ බලය මර්ධනය වීම, රජුට ස්ථිර හමුදාවක් තිබීම, ක්‍රිස්තුසභාව බිඳ වැටීම, නව පන්ති සමාජයක් බිහිවීම, ඒකීය නීති පද්ධතියක් බිහිවීම.

කරුණු තුනකට ලකුණු 03
පැහැදිලි කිරීම 03
06

9. i • මුහුදු යාත්‍රික ගවේෂණය සඳහා නැව් තැනීම, තාක්ෂණය භාවිතය
• මුහුදු යාත්‍රික ගවේෂණ සඳහා අවශ්‍ය වෙනත් ආධාර දීම.
• ශාන්ත වින්සන්ට් තුඩුව අසල ආකාශ වස්තු පරීක්ෂණාගාරයක් ඉදි කිරීම සහ පවත්වාගෙන යාමට ආධාර දීම.
(ලකුණු 03)

ii • සමාජවාදය, ලිබරල්වාදය, ධනවාදය සහ නව අධිරාජ්‍යවාද යන දේශපාලන වෙනස්වීම්
කාර්මික විප්ලවයෙන් පසු ඇති වූ වෙනස්කම්.
(සේවක වර්ජන, පෞද්ගලික ව්‍යවසායකයින් අතට ව්‍යාපාරික කටයුතු පත්වීම, ධනවතුන් කම්කරුවන් අතර ගැටුම්)
(නම් කිරීමට ලකුණු 04)

iii. පරිසර දූෂණය, නාගරීකරණය
කරුණු 2 ලකුණු 02
විස්තරයට ලකුණු 03
05


iv. • මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රතිපත්තිය 1789 අගෝස්තු 29 දින එළිදක්වීය. එහි වගන්ති මෙසේ දැක්විය හැකිය.
• සියලු මිනිසුන් එක සමානයි. • ඔවුන් නීති සම්පාදනයට සහභාගි විය යුතුය.
• අදහස් ප්‍රකාශ කිරීමට හා අයුක්තියට නැඟී සිටීමට බලයක් ඔවුන්ට ඇත.
• රදළයින්ගේ බලය අහෝසි විය.
• පූජක බලතල අහෝසිකර කතෝලික සභාව රජයේ ආයතනයක් බවට පත් කළේය.
• මහජනයාව රජුගේ කැමැත්ත පරිදි සිරභාරයට ගැනීම කළ නොහැකි විය.

10. i. • ජාතීන් අතර ඇතිවන ආරවුල් සාකච්ඡා මගින් විසඳා ගැනීම.
• ආර්ථික සම්බාධක පැනවීම මගින් ආක්‍රමණ වැළැක්වීමට කටයුතු කිරීම.
• මානව වර්ගයාගේ සාමකාමී පැවැත්ම සඳහා අවශ්‍ය වෙනත් තීරණ ගැනීම.
• ජාත්‍යන්තර සහයෝගය හා අවබෝධය ගොඩනැංවීම
• කුඩා රාජ්‍යයන්ගේ නිදහස හා ස්වාධීනත්වය ඇතිකර දීම.
(අරමුණු 3ට ලකුණු 03)


ii. • ජර්මන් ජාතිය නිර්මල ආර්යයන්ගෙන් පැවත එන ලෝකයේ ඉතාම උතුම් මානව වර්ගයක් ලෙස දැක්වීම.
• සැමවිටම යුදෙව්වන් හෙළාදැකීම.
• විරුද්ධවාදීන් විනාශ කිරීම, රහස් හමුදාව මගින් තොරතුරු රැස්කිරීම
• රාජ්‍ය නායකයා ජාතියේ ආත්මීය සළකුණ ලෙස සැලකීම
• නායකයාට අසීමිත බලතල හිමිවිය යුතු වීම හා ආර්ථික ක්‍රමය රජයේ දැඩි පාලනයට නතුවීම.
(ලක්ෂණ 4ට ලකුණු 04)

iii. • ඇමරිකාවේ ඇතිකළ මාර්ෂල් සැලැස්ම තුළින් පරාජිත රටවල් නගා සිටුවීමට ක්‍රියාකිරීම.
• බ්‍රිතාන්‍ය හා ප්‍රංශය තමන් යටතේ තිබුණ යටත් විජිතවලට නිදහස ලබාදීම.
• ලෝක සාමය ඇතිකිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම.
කරුණු 2කට ලකුණු 02
විස්තරයට ලකුණු 03
05

iv. • පරමාණු බලශක්ති කොමිසම පිහිටුවීමෙන් පරමාණු බලශක්තිය පාලනය කිරීමට ක්‍රියාකිරීම.
• ඉරානය තුළ රැඳී සිටි රතු හමුදාව ඉවත් කිරීම.
• සූවස් ඇල සම්බන්ධව ඇතිවීමට ගිය යුද්ධය වැළැක්වීම.
• දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදයට පිළියම් යෙදීම.
• ලොව සැම රටකම ආහාර නිෂ්පාදනයට මාර්ග සැලැස්වීම.
• වසූරිය එන්නත ලෝකයෙන් තුරන් කිරීමට කටයුතු කිරීම.
• බර්ලින් ප්‍රශ්නය, කියුබානු මිසයිල අර්බුදය, කොරියානු අර්බුදය, කාම්බෝජය හා රුවන්ඩා අර්බුදයන් විසඳීම
ප්‍රයත්න දැක්වීමට ලකුණු 03
පැහැදිලි කිරීමට ලකුණු 03
06




2012 අවසාන වාර විභාගය - ඉතිහාසය 11 (ii) පිළිතුරු සිතියම




2012 අවසාන වාර විභාගය - ඉතිහාසය 11 (ii) පිළිතුරු සිතියම